# කාර්ය සාධන වාර්තාව

# 2023

**නීති කටයුතු දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**නීති කටයුතු දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය: 323**

## අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2008 වර්ෂයේ ස්ථාපිත මෙම දෙපාර්තමේන්තුව, අයවැය ක්‍රියාවලිය ඇතුළු මූල්‍ය කළමනාකරණයට අදාළ විවිධ නීති රෙගුලාසි හා අදාළ කෙටුම්පත් සකස් කිරීමේදී මෙන්ම, විදේශ රටවල්, මූල්‍ය ආයතන හා මහ බැංකුව සමග සම්බන්ධ වන මූල්‍ය ගිවිසුම් සකස් කිරීමේදී ද, මුදල් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ඇති වන නඩු හා පැමිණිලි වලට අදාළ කටයුතු , විවිධ ගිවිසුම්වලට අදාළ නීතිමය කටයුතු ආදිය සම්බන්ධයෙන් ද නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කිරීම, සෙසු දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය නීතිමය උපදෙස් සැපයීම ආදී අරමුණු සඵල කරගැනීම උදෙසා කටයුතු කරනු ලබයි.

### 1.2 ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව

ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් අංක මු.8/3/20 හා 2008.01.25 දිනැතිව **"මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ආයතනික හා සංවිධාන ව්‍යුහය ශක්තිමත් කිරීම"** මැයෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008.01.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී 2008.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2008.02.01 දින සිට නීති කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

### 1.3 ආයතනයේ පරමාර්ථ

විවිධ ව්‍යාපෘති ගිවිසුම් හා මුදල් නීති පනත් කෙටුම්පත් සම්බන්ධව කටයුතු කිරීමට මෙන්ම රජය වෙනුවෙන් ඇති වන නඩු හා පැමිණිලි වලට අදාළ කටයුතු කිරීමට සහ විවිධ ගිවිසුම් හා නීති කෙටුම්පත් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්ධතාවයකින් කටයුතු කිරීම. මුදල් අමාත්‍යාංශය යටතේ පවතින සෙසු දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය නෛතිකමය උපදෙස් සැපයීම දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වේ.

### 1.4 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  **"නෛතික, නීති සම්පාදන හා නියාමන කාර්යයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහය හා නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව හා අනෙකුත් නියාමන නියෝජිතායතන මෙන්ම ද්විපාර්ශවික හා බහුපාර්ශවික ආධාර සපයන ආයතන අතර අතරමැදියා වෙමින් වෘත්තීයමය දායකත්වයක් සපයන හොඳම දෙපාර්තමේන්තුව වශයෙන් කටයුතු කිරීම."**

- **මෙහෙවර**

නෛතික, නීති සම්පාදන හා නියාමන කරුණු සම්බන්ධයෙන් මෙන්ම රජය හා වෙනත් රාජ්‍යයන්, ද්විපාර්ශවික හා බහුපාර්ශවික ආධාර ලබා දීමේ නියෝජිතායතන සමඟ විදේශීය ණය හා ප්‍රදාන පිළිබඳව අත්සන් කරනු ලබන ගිවිසුම් හා කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මගින් මැනවින් සලකා බලන ලද නීති උපදෙස් හා මතයන් මෙන්ම නියෝජනයක්ද ලබා දීමට හැකි වන පරිදි අදාළ තොරතුරු හා ප්‍රතිපත්තිමය තීරණ ලබා දෙමින් පහසුකම් සැලසීම.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු වල නියැලීම හා රාජ්‍ය ප්‍රතිපත්ති, නීති ප්‍රඥප්ති/රෙගුලාසි බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා ඵලදායි දායකත්වයක් ලබා දීම.

අවශ්‍ය අවස්ථාවන් වලදී නෛතිකමය කාර්යයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට අවශ්‍ය නෛතික සහාය ලබා දීම.

- **අරමුණු**

1. නීති, නීති සම්පාදනය හා නියාමන කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සෙසු දෙපාර්තමේන්තු, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් නියාමන නියෝජිතායතන මෙන්ම බහුපාර්ශවික හා ද්විපාර්ශවික අධාර සපයන ආයතන අතර මැදිහත් වෙමින් වෘත්තීය දායකත්වයක් සැපයීම.

2. මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවල රාජකාරි කටයුතු වඩාත් විධිමත්ව නෛතික රාමුව තුල ඉටු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා සහය ලබා දීම.

3. මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ඊට අනුබද්ධ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට විරුද්ධව පවරන ලද නඩු හා පැමිණිලිවලට අදාළ කටයුතු කිරීම, එම කටයුතුවලට අදාළ නිරීක්ෂණ සැකසීම හා උපදෙස් ලබා දීම.

## 1.5 ප්‍රධාන කාර්යයන්

මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු වල රාජකාරී කටයුතු වඩාත් විධිමත්ව නෛතික රාමුවක් තුළ ඉටු කිරීම සඳහා අවශ්‍ය උපදේශකත්වය හා සහයෝගය ලබා දීම. ඒ සඳහා මනා කළමනාකරණයක් තුලින් යහපත් පාලනයක් ඇති කිරීම අරමුණු කර ගනිමින්, මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට හා අනෙකුත් නිලධාරීන්ට විරුද්ධව පවරන ලද විවිධ

ආකාරයේ නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටිමින් හා ඒවාට අදාළව ඇතිවන නීතිමය ප්‍රශ්න නිරාකරණය කිරීමටත්, ගිවිසුම් හා පනත් කෙටුම්පත් සැකසීම සම්බන්ධයෙනුත් නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කරමින් හා එම වගකීම් ඉටු කරන වෘත්තීමය නිපුණත්වයක් ඇති කාර්ය මණ්ඩලයක සහභාගීත්වය සහිතව නීති කටයුතු දෙපාර්තමේන්තුව තම රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි.

### 1.5.1 නඩු කටයුතු සම්බන්ධ කාර්යභාරය

මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ඊට අනුබද්ධිත දෙපාර්තමේන්තු වල නිලධාරීන්ට විරුද්ධව පවරන ලද නඩු හා පැමිණිලි වලට අදාළ කටයුතු කිරීම හා එම කටයුතු වලට අදාළ නිරීක්ෂණයන් සැකසීම, විස්තර ආදිය ලබා ගැනීම, ඒවා නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දෙමින් සම්බන්ධීකරණය කරමින් අදාළ ලේඛන සකස් කිරීමේ කටයුතු වල නියැලීම, නීතිපතිවරයා සමඟ පැවැත්වෙන උපදේශන සාකච්ඡා වලට අදාළ දෙපාර්තමේන්තු නියෝජිතයන් සමඟ සහභාගී වීම සහ මානව හිමිකම් කොමිෂන් සභා විමසීම් සඳහා සහභාගී වීම නීති කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

එසේම මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු විසින් වෙනත් පාර්ශවයන්ට එරෙහිව පවරන නඩු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම හා නඩු පැවරීම.

**2023 වර්ෂයට අදාළ නඩු කටයුතු විස්තර සටහන -**

| | 2022-12-31 දින වන විට අවසන්ව නොමැති නඩු | 2023 වර්ෂය තුළ ලැබී ඇති නඩු සංඛ්‍යාව | 2023-12-31 දින වන විට අවසන් වී ඇති නඩු සංඛ්‍යාව | 2023-12-31 දින වන විට අවසන් වී නොමැති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 287 | 51 | 61 | 277 |
| අභියාචනාධිකරණය | 136 | 33 | 20 | 149 |
| මහාධිකරණය | 12 | 02 | 04 | 10 |
| දිසා අධිකරණය | 16 | 03 | 04 | 15 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 01 | - | 01 | - |
| පරිපාලන අභියාචනා විනිශ්චය සභාව | - | - | - | - |
| මහේස්ත්‍රාත් අධිකරණය | - | 02 | - | 02 |
| කම්කරු විනිශ්චය සභාව | - | - | - | - |
| එකතුව | **452** | **91** | **90** | **453** |

### 1.5.2 නීති උපදෙස් ලබා දීම

මුදල් අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුවලට අදාළව පැන නගින්නා වූ නීතිමය ගැටළු උපදෙස් පතා නීති අංශයට ඉදිරිපත් කරන අවස්ථා වලදී ඒ හා සම්බන්ධ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම හා එම නීතිමය ගැටළු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව හා වෙනත් අදාළ දෙපාර්තමේන්තු හා ආයතන යනාදිය සම්බන්ධීකරණය කර ගැනීම මඟින් නිරාකරණය කර ගැනීම, නීති කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන තවත් කාර්යයකි.

**2023 වර්ෂය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට/ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ලැබී ඇති ලිපිගොනු විස්තර සටහන -**

| **2022.12.31 වන විට අවසන් නොමැති ලිපිගොනු සංඛ්‍යාව (ගිවිසුම් හැර)** | **2023.01.01 සිට 2023.12.31 දක්වා ලැබී ඇති ලිපිගොනු සංඛ්‍යාව** | **2023.12.31 දිනට වැඩ කටයුතු අවසන් වී නොමැති ලිපිගොනු සංඛ්‍යාව** |
|---|---|---|
| 08 | 02 | 08 |

### 1.5.3 ගිවිසුම් හා අනුබද්ධ කාර්යයන්

රටේ සංවර්ධනය උදෙසා වන විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු හරහා විදේශ රාජ්‍යයන්, ද්විපාර්ශවික සහ බහු පාර්ශවික සංවිධාන මඟින් ලැබෙන ණය මුදල් හා ආධාර වලට අදාළ ගිවිසුම් විශ්ලේෂණය කිරීම, පාර්ශවයන් සමඟ සාකච්ඡා පැවැත්වීම හා ඒවා අත්සන් කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට අනුබද්ධ සියළුම කාර්යයන් ඉටු කිරීම හා නීතිපතිවරයාගේ අවසාන නිෂ්කාෂණය ලැබෙන තෙක් සම්බන්ධීකරණය කිරීම, නීති කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

### 1.5.4. නීති හා රෙගුලාසි සකස් කිරීමේ ක්‍රියාවලිය

මුදල් අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු හා ආයතන වලට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීති/රෙගුලාසි බවට පත් කිරීමේදී හා අදාළ මූලික කෙටුම්පත් හා වෙනත් අදාළ සංශෝධනයන් සකස් කිරීම සහ ඒවා අවසානාත්මක වශයෙන් නීති බවට පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම, නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයක් වේ.

**2023 වර්ෂයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද පනත්**

1. 2023 අංක 34 දරණ විසර්ජන පනත
2. 2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනත
3. 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත
4. 2023 අංක 33 දරන මුදල් පනත

**2023 වර්ෂයේ පාර්ලිමේන්තුව වෙත අනුමැතියට ඉදිරිපත් කළ සහ දැනට කටයුතු සිදු කෙරෙමින් පවතින පනත් කෙටුම්පත්**

1. සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත.
2. ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත් කෙටුම්පත.
3. 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත් කෙටුම්පත.
4. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතට සංශෝධන.
5. 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතට සංශෝධන.
6. කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත.
7. 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සංශෝධන.
8. 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන.
9. 2005 අංක 25 දරණ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන.
10. 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන.
11. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට සංශෝධන.
12. දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතට සංශෝධන.
13. ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම් ආඥා පනතට සංශෝධන .
14. 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධන.
15. 2009 අංක 23 දරණ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (සංශෝධිත) පනත.
16. රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත.
17. 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනත සංශෝධනය කිරීම.
18. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය සඳහා වූ පනත.
19. දායකත්ව ජාතික විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ පනත් කෙටුම්පත.
20. සුරාබදු ආඥා පනත සඳහා නව පනතක් හඳුන්වාදීම.
21. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත.
22. 1988 අංක 30 දරන බැංකු පනන සංශෝධනය කිරීම.
23. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත.

### 1.5.5 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

විවිධ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශයන් සඳහා මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේ දී ඊට අදාළ නෛතික නිරීක්ෂණ ඉදිරිපත් කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2023.01.01 සිට 2023.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩල සංදේශ 248 ක් සඳහා නිරීක්ෂණ පිළියෙළ කර ඉදිරිපත් කර ඇත.

### 1.5.6 2023 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සමාගම්


**1.** පබ්ලික් එන්ටර්ප්‍රයිසස් හෝල්ඩින් කම්පැනි ලිමිටඩ්

**2.** ජාතික ණය සුරැකුම් ආයතනය

### 1.5.7 වෙනත් කටයුතු

1. මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග පරිච්ඡේදය සකස් කිරීම.
2. පනත් වල විධිවිධාන අනුව මුදල් අමාත්‍යාංශය සකස් කරන වාර්තා අවසානාත්මක වශයෙන් සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීම.
3. එසේම තාක්ෂණික ඇගයුම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු සඳහා නිලධාරීන් පත්කරනු ලබන අවස්ථා වලදී නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට පත් කිරීම.
4. නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු වල මනා කළමනාකරණයක් ඇති කිරීම හා එකී නිලධාරීන්ගේ හැකියා සහ විෂය කරුණු වලට අදාළ විශේෂඥ දැනුම වර්ධනය උදෙසා දේශීය පුහුණු පාඨමාලා වලට සහභාගී කරවීමට කටයුතු සලස්වා ඇත.
5. නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් තම දෙපාර්තමේන්තුවේ කටයුතු පහසු කර ගැනීම සඳහා නඩු කටයුතු හා අනෙකුත් නීති උපදෙස් සඳහා ලැබෙන ලිපිගොනු, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් දෙපාර්තමේන්තු විසින් නීතිපති අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ගිවිසුම් සම්බන්ධ ලිපිගොනු, සහභාගී වූ දේශීය පුහුණු අධ්‍යයන පාඨමාලා, දෙපාර්තමේන්තු වත්කම් ලේඛනය හා නිවාඩු ලේඛනයන් සඳහා පරිගණකගත කරන ලද දත්ත පද්ධතීන් (Data Bases) පවත්වාගෙන යනු ලබයි.

## 1.6 සංවිධාන සටහන



අධ්‍යක්ෂ ජනරාල්
අති. අධ්‍යක්ෂ ජනරාල් ****
අධ්‍යක්ෂ (නීති)
අධ්‍යක්ෂ (නීති)
නීති නිලධාරී
නීති නිලධාරී
නීති නිලධාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
පරිගණක/යතුරුලියන ලේකම් (ඉංග්‍රීසි/සිංහල) ****
රියදුරු
රියදුරු
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
පුරප්පාඩු සහිත තනතුරු
****
වැඩ බැලීමේ පදනම මත සේවය කරයි.
****
තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමතයි.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

- අදාළ නොවේ -

## 02. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (COPA) මෙහෙය වීමෙන් රජයේ ආයතන වල පොදු ගිණුම් තැබීමේ ක්‍රම, මූල්‍ය පාලනය හා කාර්ය සාධනය පරිගණක ජාලගත ක්‍රමය මඟින් වාර්ෂිකව ඇගයීමට ලක්වී ඇත. එසේම පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද පනත් සම්මත කර ගැනීමට හැකි වී ඇත. අනුමත කර ගන්නා ලද එම පනත් හි අන්තර්ගත කරුණු මගින් දේශීය ආර්ථික වර්ධනයට ඍජු සහ වක්‍රාකාරයෙන් දායකත්වයක් ලබා දී ඇත. 2023 වර්ෂයේ රටේ ප්‍රධාන අරමුණු වූ ආර්ථික සංවර්ධනය සහ මූල්‍ය විනය පවත්වා ගෙන යාමට අවශ්‍ය පනත් බොහෝමයක් සකස් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව දායක විය. එසේම 2023 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද බොහෝ පනත් මහා භාණ්ඩාගාර ක්‍රියාවලිය හා සම්බන්ධ බැවින් 2024 වර්ෂයේදී ඒවා ක්‍රියාත්මක කිරීමට ද මෙම දෙපාර්තමේන්තුව දායක වේ.

ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර<br>
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>
නීති කටයුතු දෙපාර්තමේන්තුව

## 03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සධනය

### 3.1 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

| අයවැය 2023 රු. | | සටහන | තත්‍ය - 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | 0 | 0 | |
| | | | | 0 | |
| - | ආදායම් බදු | **1** | 0 | | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | 0 | 0 | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | 0 | 0 | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | 0 | 0 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 0 | 0 | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **0** | 0 | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 18,285,000 | 16,902,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 4,500 | 4,400 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 646,144 | 1,399,904 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 3,550 | 0 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **18,939,194** | 18,306,304 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **18,939,194** | 18,306,304 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 223,659 | 205,689 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 18,715,535 | 18,100,615 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **0** | 0 | ඒසීඒ-2(ii) |
| 16,145,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 13,566,935 | 13,238,840 | |
| 6,550,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 4,968,857 | 3,857,312 | |
| 200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 89,155 | 112,642 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - | |
| **22,900,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **18,624,947** | 17,208,794 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | - | - | ඒසීඒ-2(ii) |
| - | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | - | 26,896 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| | හැකියා වර්ධනය | **14** | - | - | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| **-** | **මුළු මූලධන වියදම් (උ)** | | **-** | 26,896 | |
| | තැන්පතු ගෙවීම් | | 4,500 | 4,400 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 760,381 | 1,169,123 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 764,881 | 1,173,523 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 19,389,828 | 18,409,213 | |
| **-** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (674,293) | (308,598) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (674,293) | (308,598) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |
| | | | (674,293) | (308,598) | |

## 3.1.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 7,732,914 | 7,670,699 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 2,095,380 | 1,981,143 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **9,828,294** | **9,651,842** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 2,095,380 | 1,981,143 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 7,732,914 | 7,670,699 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **9,828,294** | **9,651,842** |

පිටු අංක...18....සිට ...51... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...52... සිට ...59... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : කේ.එම්.එම්. සිරිවර්ධන
මහාභාණ්ඩාගාරලේකම් සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

.........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 19/02/2024
ජී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නීති කටයුතු දෙපාර්තමේන්තුව
කොළඹ - 01 2

.........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 19/02/2024
කේ.එම්.බී.පී. වීරසිංහ
ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග.සේ. I)
නීති කටයුතු දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

### 3.1.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 3,550 | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 611,918 | 626,107 |
| අග්‍රිම ලැබීම් | 18,285,000 | 16,902,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 646,144 | 642,327 |
| තැන්පතු ලැබීම් | 4,500 | 4,400 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **19,551,112** | **18,174,834** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 18,473,417 | 17,024,942 |
| සහනාධාර සහ මාරුකිරීම් | 89,155 | 112,642 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 223,659 | 205,689 |
| අත්තිකාරම් ගෙවීම් | 760,381 | 800,265 |
| තැන්පතු ගෙවීම් | 4,500 | 4,400 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **19,551,112** | **18,147,938** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **-** | **26,896** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | - | 26,896 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **-** | **26,896** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **-** | **(26,896)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **-** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතීනම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 22,900,000 | 22,900,000 | 18,624,947 | 81% |
| ප්‍රාග්ධන | - | - | - | - |

**3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය**

| පරිත්‍යාගය කළ ආයතනය | පරිත්‍යාගයේ අරමුණු | පරිත්‍යාග මුදල |
|---|---|---|
| | - නැත- | |

**3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 7,593,337.00 | 7,732,914.00 | - | 100% |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

**3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව****

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද 2024 මැයි 10 දිනැති අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට **ඇමුණුම 1** ලෙස මෙම වාර්තාවේ අවසානයට අමුණා ඇත.

## 04. පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| පනත් කෙටුම්පත් | √ | | |
| දෙපාර්තමේන්තුව වෙත යොමු කල පැහැදිලි කිරීම් සඳහා පිළිතුරු සැපයීම | √ | | |
| ගිණුම්කාරක සභාවේ මග පෙන්වීම් පසු විපරම් කිරීම | √ | | |
| විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධව පසු විපරම් කටයුතු | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම | √ | | |
| මූල්‍ය ප්‍රකාශන,වාර්තා නියමිත කාල පරිච්ඡේදය තුල ඉදිරිපත් කිරීම | √ | | |

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%- 100% |
| | අදාළ නොවේ. | | | | |
| | | | | | |
| | | | | | |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව ඍජු ලෙස සම්බන්ධ නොවේ.-

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 11 | 07 | 04 |
| තෘතීයික | - | - | - |
| ද්විතියික | 06 | 05 | 01 |
| ප්‍රාථමික | 05 | 04 | 01 |

### 6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩුව පැවතීම නිසා ආයතනයේ කාර්ය භාරය අනලස්ව ඉටු කිරීමට අපහසුතා ඇති වේ.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Training Programme on Legal Aspects of International Financial Instructions | 01 | 2023.01.09 - 2023.01.13 | 93.436 | Not Specially identified | විදේශීය | Learned History and other Law related to the international financial Institutions |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර ආයෝජන ආකර්ශනය කරගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | සති 02 | 153.789 | | විදේශීය | ජාත්‍යන්තර ආයෝජන ආකර්ශණය කරගැනීම පිළිබඳ විධික්‍රම අධ්‍යයනය කරන ලදි. |
| මාර්ග මූලපිරීමේ දෘෂ්ඨිකෝණයෙන් මූල්‍ය නායකයින් සඳහා වූ උසස් සම්මන්ත්‍රණය | 01 | දින 08 | 113.274 | | විදේශීය | චීනයේ කළමනාකරණ ගිණුම්කරණ මාර්ගෝපදේශ පද්ධතිය, චීන ව්‍යවසායන් හි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | අභ්‍යන්තර පාලනය හා අවධානම් කළමනාකරණ පද්ධතිය, චීනයේ බදු ක්‍රමය හා ගෝල්ඩන් ටැක්ස් ව්‍යාපෘතියේ අත්දැකීම් පිළිබඳ අධ්‍යයනය කරන ලදී. |
| ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | පැය 58 | - | - | දේශීය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ලංසු ඇගයීම, ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සහ අදාළ ප්‍රසම්පාදන කටයුතු අධ්‍යයනය කරන ලදී. |
| රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව නීති සම්පාදන වැඩමුළුව | 02 | දින 5 | - | - | දේශීය | මෙම පුහුණු වැඩමුළුව එක්සත් ජනපද වාණිජ ආයතනය මගින් ක්‍රියාත්මක විය. මෙහිදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීමේ මූලික කටයුතු සිදු කරන ලදි. |
| රේගු දෙපාර්තමේන්තුවේ අභිරුචි රාජකාරී හා කාර්යයන් ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය | 02 | පැය 05 | - | - | දේශීය | රේගු දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ මූලික අවබෝධයක් ලබාගන්නා ලදි. |
| ව්‍යවස්ථාපිත ආයතනයන්හි ප්‍රතිව්‍යුහගතකරණයන්ට අදාළව නායකත්ව පුහුණු වැඩමුළුව | 02 | පැය 02 | - | - | දේශීය | නායකත්ව ගුණාංග, සහයෝගීත්ව කුසලතා හා සම්බන්ධීකරණ හැකියාවන් වැඩිදියුණු කරගැනීමට මෙම පුහුණු වැඩමුළුව මගින් දායකත්වය ලැබුණි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තේමාත්මක වැඩ කණ්ඩායම් පිළිබඳ වැඩමුළුව | 01 | දින 01 | - | - | දේශීය | ප්‍රචණ්ඩ අන්තවාදය හඳුනාගැනීම හා වැළැක්වීමට පියවර ගැනීම පිළිබඳ අධ්‍යයනය කරන ලදී. |
| වාණිජ නීති වැඩසටහන | 01 | දින 3 | - | - | දේශීය | ශ්‍රී ලංකාවේ වාණිජ නීති ක්‍රියාපටිපාටිය සංවර්ධන විය යුතු ආකාරය පිළිබඳ අධ්‍යයනය කරන ලදී. |
| ඵලදායීතා පුහුණුකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 01 | දින 5 | - | - | දේශීය | තත්ත්ව කව සහ තත්ව පාලන මෙවලම්, කයිසෙන්, හරිත ඵලදායීතාව ඇතුළු ඵලදායීතා මෙවලම් පිළිබඳ පුළුල් පරාසයක කරුණු අධ්‍යයනය කරන ලදී. |
| ආර්ථික පරිවර්තනය සහ තිරසාර ආර්ථික වර්ධනයට සහාය වීම පිළිබඳ සම්මන්ත්‍රණය | 02 | පැය 03 | - | - | දේශීය | තිරසාර ලෙසින් ආර්ථික වර්ධනයට සහාය වීම පිළිබඳ චෙක් ජනරජයේ අත්දැකීම් ඇසුරින් දැනුවත් වීම. |
| 2023 වසර සඳහා මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා වන පුහුණු වැඩසටහන | 01 | පැය 3 1/2 | - | - | දේශීය | වර්ෂාවසානයේදී මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කරගැනීම පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී. |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

දෙපාර්තමේන්තුව වෙත යොමු වන පනත් කෙටුම්පත් වලට අදාළ නිරීක්ෂණ සකස් කිරීම සඳහාත්, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු සඳහාත් වර්ෂාවසානයේදී මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කරගැනීම සඳහාත් දායක වීමට හැකියාව ලැබී ඇත.

## 07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අදාල නොවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අදාල නොවේ | | |
| **03.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අදාළ නොවේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අදාළ නොවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අදාළ නොවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අදාළ නොවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අදාළ නොවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාළ නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අදාළ නොවේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12.** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අදාළ නොවේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අදාළ නොවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අදාළ නොවේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අදාල නොවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාල නොවේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අදාළ නොවේ | දෙපාර්තමේන්තුව සෘජුව මහජනයා සමග සම්බන්ධ නොවීම. | ඉදිරියේදි මහජනයා සමඟ සෘජු සම්බන්ධතා සිදු වුවහොත් සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කල හැකි |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අදාළ නොවේ | – | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20.** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/C/23/30/DLA/FA  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2024 මැයි 10 දින

ගණන්දීමේ නිලධාරී
නීති කටයුතු දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

2023 වර්ෂය සඳහා රු.22,916,000 ක අග්‍රිම මුදලක් ඉල්ලුම් කිරීම සැලසුම් කර තිබුණු නමුත් වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් රු.19,987,000 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණි. එබැවින් දෙපාර්තමේන්තුව සැලසුම් කළ හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර සියයට 13 ක විචල්‍යතාවයක් නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 ප්‍රතිපාදන ඉතිරිවීම්

අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 02(අ) ඡේදය පරිදි 2023 අයවැය ඇස්තමේන්තු වල ඉඩ හැර ඇති වැය විෂයයන් හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් අදහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීමට කටයුතු කළ යුතු විය. දෙපාර්තමේන්තුවේ අදාල වැය විෂයන්ගේ ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.10.380,629 න් රු.3,074,371 ක් හෙවත් සියයට 23 ක් ඉතිරි කර තිබුණි.

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| යොමුව | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | අලාභහානිය සිදු වූ දිනයේ සිට (නැතහොත් ඒ බව දැනගන්නට ලැබුණු දිනයේ සිට) තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයේදි අස්ථානගතවූ දෙපාර්තමේන්තුවේ ලැප්ටොප් |

| | |
|---|---|
| | පරිගණකය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කර සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට විගණන දිනය වූ 2024 මාර්තු 22 වන විටත් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (ii) මු.රෙ.103(1), මු.රෙ.104, මු.රෙ.109(1) හා මු.රෙ.109(2) | උක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව, අයකර ගත යුතු මුදල අයකර ගැනීමටත්, පොතෙන් කපා හැරීමට හෝ ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තෝ නිශ්චය කර අත්හැරීමේ නියෝගයක් නිකුත් කළ යුතු වුවද පරිගණක යන්ත්‍රය නැතිවී වසර 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ඒ සම්බන්ධව ක්‍රියාකර, කටයුතු අවසන් කර නොතිබීම නිසා හානි පාඩු ලේඛනය තුල පරිගණක යන්ත්‍රයේ වටිනාකම වූ රු.216,153 ක මුදල තවදුරටත් නිරවුල් වී නොතිබුණු බව නිරීක්ෂණය විය. |
| (iii) මු.රෙ.315 | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව නියමිත නිලධාරීන් විසින් අවශ්‍ය ඇප තබන බවට ගණන්දීමේ නිලධාරි වග බලාගත යුතු වුවත් 2023 වර්ෂයේදී නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අදාල තනතුරුවල සේවය කරන ලද නිලධාරීන් ඇප තැබීමක් කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (iv) මු.රෙ.891(i) | ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක්, එක් එක් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ අකාරාදි ක්‍රමයට පිළියෙල කොට පවත්වාගෙන යා යුතු වුවත් නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටුකිරීමේ ප්‍රගතිය

(අ) 2023 වර්ෂයේ පාර්ලිමේන්තුව වෙත අනුමැතියට ඉදිරිපත් කළ සහ දැනට කටයුතු සිදු කරමින් පවතින පනත් කෙටුම්පත් 24 ක් පවතී. එයින් 11 ක් 2021 සහ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් තුළ අන්තර්ගත කර තිබූ පනත් වන අතර ඒවායේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

- 1951 අංක 38 දරන ලෝහෝර් ආයිං ණය අරමුදල් පනත
- කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණ කිරීමේ පනත
- සුරක්ෂිතලත් ගණුදෙනු පනත
- 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන පනත
- 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනතට සංශෝධන
- 2006 අංක 06 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන
- 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන
- 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධන
- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත්කෙටුම්පත
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත සංශෝධන
- 1990 අංක 02 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධාන) පනත සංශෝධන

(ආ) නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි 31 දිනට අවසන් කර නොමැති නඩු සංඛ්‍යාව 452 ක් වූ අතර, 2023 වර්ෂය තුළ දී ලැබී ඇති නඩු සංඛ්‍යාව 91 කි. සියලුම නඩු අතරින් නඩු 90 ක් 2023 වර්ෂය තුළ විසඳී ඇති අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී නොමැති නඩු සංඛ්‍යාව 453 ක් විය. විස්තර පහත දැක්වේ.

| | 2023.01.01 දින වන විට අවසන්ව නොමැති නඩු | 2023 වර්ෂය තුළ ලැබී ඇති නඩු | සමාලෝචිත වර්ෂය තුළ අවසන් වී ඇති නඩු සංඛ්‍යාව | 2023.12.31 දින වන විට අවසන් වී නොමැති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 287 | 51 | 61 | 277 |
| අභියාචනාධිකරණය | 136 | 33 | 20 | 149 |
| මහාධිකරණය | 12 | 02 | 04 | 10 |
| දිසා අධිකරණය | 16 | 03 | 04 | 15 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 01 | -- | 01 | -- |
| මහේස්ත්‍රාත් අධිකරණය | -- | 02 | -- | 02 |
| එකතුව | 452 | 91 | 90 | 453 |

**4. මානව සම්පත් කළමනාකරණ**

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 22 ක් වූ අතර, ඉන් තනතුරු 06 ක් පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩු තනතුරුවලින් 04 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. එම පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට